# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 13,122 — 1962 මැයි 17 වැනි බ්‍රහස්පතින්ද — 1962.5.17**

(ආණ්ඩුවේ බලයේ පිට ප්‍රසිද්ධ කරන ලදි)

## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 743 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 744 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය | 744 |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 745 |
| රෙජිස්ට්‍රාර්වරුන් ගේ පත් කිරීම් ආදිය ... ... | 746 |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 747 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... — | 751 |
| "සුරාබද්ද ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 188**

අංකය: ඩී/වීඑප්/18/ඒ.

**රාජකීය ලංකා සෙවෙචඡා නාවික හමුදාව**

**අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් භාරගන්නා ලද කොමිෂන් බලපත්‍ර ලත් ධුරයකින් ඉල්ලා අස්වීමක්**

1962 පෙබරවාරි මස 10 වැනි දින සිට කොමිෂන් බලපත්‍ර ලත් ධුරයකින් ඉල්ලා අස්වීම :—

ලෙප්ට්ටිනන්ට් ෆ්‍රෙඩ්රික් රොඩ්නි ලෝරන්ස් පර්ඩිනන්ඩ්ස්, රාජකීය ලංකා ස්වේච්ඡා නාවික හමුදාව.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ක්‍යූ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ,
ස්ථිර ලේකම්.

කොළඹ 1,
1962 මැයි මස 5 වැනි දින.

5-546

---

**1962 අංක 189**

අංකය: ඩී. 33/රෙක්ට්.

**රාජකීය ලංකා ගුවන් හමුදාව**

**අග්‍රාණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්**

1962 ජනවාරි 1 වැනි දින සිට, වින්ග් කොමාන්ඩර් වශයෙන් :—
ස්කොඩ්රන් ලීඩර් ප්‍රේමරත්න ගුණසිංහ වල්පිට—01010—පාලන.

1962 ජනවාරි 1 වැනි දින සිට, ස්කොඩ්රන් ලීඩර්වරු වශයෙන් :—
තාවකාලික ස්කොඩ්රන් ලීඩර් පත්මන් හරිස්ප්‍රසාද මෙන්දිස් 01029—පොදු කාර්ය/නියමු.

තාවකාලික ස්කොඩ්රන් ලීඩර් ධර්මවන්ස ඩයස් ද සිල්වා සෙනෙවිරත්න—01030—පොදු කාර්ය/නියමු.

තාවකාලික ස්කොඩ්රන් ලීඩර් රාජනායගම් බාලචන්ද්‍රන්—01021—ගුවන් ගමනාගමන පාලන.

තාවකාලික ස්කොඩ්රන් ලීඩර් පොන්නු කණගසබි නාගරාජා—01012—කාර්මික/ඉංජිනේරු.

තාවකාලික ස්කොඩ්රන් ලීඩර් හබරකඩ ආරච්චිගේ දොන් රණසිංහ—01011—කාර්මික/සංඥ.

තාවකාලික ස්කොඩ්රන් ලීඩර් ඇන්තනි හක්ස්ලි පුච්මානසිංහ—01025—උපකරණ.

1962 ජනවාරි 1 වැනි දින සිට, තාවකාලික ස්කොඩ්රන් ලීඩර්වරු වශයෙන්:—

ප්ලයිට් ලෙප්ටිනන්ට් රත්නසභාපති විවේකානන්දන්—01034—පොදු කාර්ය/නියමු.

ප්ලයිට් ලෙප්ටිනන්ට් ශ්‍රී මහේන්ද්‍ර විමලධර්ම සිටුනායක—01042—පොදු කාර්ය/නියමු.

ප්ලයිට් ලෙප්ටිනන්ට් ඩග්ලස් වික්‍රමසිංහ—01020—කාර්මික/ඉංජිනේරු.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ක්‍යූ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ,
ස්ථිර ලේකම්.

1962 මැයි 7 වෙනිදා,
කොළඹ දීය.

5—535

1962 අංක 190

අංකය : ඞී. 23/රෙක්ට්/26.

## රාජකීය ලංකා ගුවන් හමුදාව

**අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද රාජකීය ලංකා ගුවන් හමුදාවේ නිත්‍ය උපසේවයට ඇතුළත් කිරීමක්**

1962 පෙබරවාරි මස 22 වන දින සිට මෙහි පහත නම් සඳහන් නිලධාරියා රාජකීය ලංකා ගුවන් හමුදාවේ සක්‍රීය සේවා ලැයිස්තුවේ සිට නිත්‍ය උප සේවයට මාරුකර තිබේ.

පියසර නිලධාරි අයි. ඒ. ඒ. ද අබෲ (01032)—සාමාන්‍ය වැඩ/නියමු.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1962 මැයි මස 7 වෙනි ද,
කොළඹ දීය.

5-574

---

# රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 191

ඒ.8/62.

1962 අප්‍රේල් මස 16 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු අධිනීතිඥ සී. ඇන්. ද ඇස්. ජේ. ගුණවර්ධන මහතා ඇටෝර්නි ජනරාල් දෙපාර්තමේන්තුවේ ආණ්ඩුවේ අධිනීතිඥයකු වශයෙන් වැඩ බැලීමට.

ඒ. 8/62.

1962 මාර්තු මස 28 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු අධිනීතිඥ ජී. පී. ඇස්. ද සිල්වා මහතා ඇටෝර්නි ජනරාල් දෙපාර්තමේන්තුවේ ආණ්ඩුවේ අධිනීතිඥයකු වශයෙන් වැඩ බැලීමට.

සී. ජ. වල්පිට,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 මැයි මස 12 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදෙර මහ ලේකම්
ගොඩනැගිල්ලේ, රාජ්‍ය සේවා
කොමිෂන් සභා කාර්යාලයේ දීය.
තැ. පෙ. 500.

5-613

---

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

1962 අංක 192

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත්කිරීම් කර ඇත්තේය :—

අංකය : ජේඒ. 2/48.

ඒ. ඞී. ජී. ගුණවර්ධන මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 මැයි 5 වැනි දින සිට, අවිස්සාවේල්ලේ දිස්ත්‍රික් උසාවියේ අංක 9635 දරණ නඩුවේ තීන්දු දීමට, අවිස්සාවේල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 46/48.

සී. බී. වල්ගම්පාය මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 මැයි 7 වැනි දින සිට, හැටන් දිස්ත්‍රික් උසාවියේ අංක 5799, 5633, 5693 දරණ නඩුවල සහ හැටන් රික්වැස්ට් උසාවියේ අංක 8886 සහ 8888 දරණ නඩුවලද තීන්දු දීමට, නුවරඑළියේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ නුවරඑළියේ, අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑම්. 2/56 (III).

ජේ. ජී. එල්. සුවාරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ජේ. එම්. ජී. එස්. මුදන්නායක මහතා 1962 මැයි 6 වැනි දින සිට 20 වැනි දින දක්වා අවිස්සාවේල්ලේ; මහෙස්ත්‍රාත් ධුරයේ හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයේ සහ අවිස්සාවේල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයේ වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 12/48.

ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1962 මැයි 5 වැනි දින සිට, කොළඹ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 4684/සී දරණ නඩුව අවසාන වනතුරු ඇසීමට හා තීන්දුව දීමට, කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 57ඒ/57.

කේ. ඞී. ඕ. එස්. එම්. සෙනෙවිරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. එම්. අයි. ගුණරත්න මහතා 1962 මැයි 9 වැනි දින සිට 11 වැනි දින දක්වා, ගම්පොල පිහිටි උසාවියේ ක්‍රියා කරන පිණිස, මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා ගම්පොල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 34ඒ/48.

එස්. එස්. කුලතිලක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ටී. ආසිර්වාදම් මහතා 1962 මැයි 9 වැනි දින සිට 11 වැනි දින දක්වා, රත්නපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා රත්නපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 1සී/53.

එම්. එම්. අබ්දුල් කාදර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සී. කනගසිංහම් මහතා 1962 මැයි 12 වැනි 21 වැනි හා 22 වැනි දිනයන්හි, ත්‍රිකුණාමලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, ත්‍රිකුණාමලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, අනුරාධපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා අනුරාධපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 7බී/56.

එල්. එච්. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. එලියතම්බි මහතා 1962 මැයි 17 වැනි දින සිට 23 වැනි දින දක්වා, නුවරඑළියේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවරඑළියේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, නුවරඑළියේ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා බදුල්ල-හල්දුම්මුල්ල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේ.එල්. 58බී/59.

එස්. සෙල්ලයියා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. ඒ. එල්. කොරෙයා මහතා 1962 මැයි 16 වැනි දින, හලාවත, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හලාවත, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, පුත්තලමේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා පුත්තලමේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 54ඒ/58.

එල්. සමරතුංග මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එල්. ද සිල්වා මහතා 1962 ජූනි 4 වැනි දින සිට 8 වැනි දින දක්වා, බලපිටියේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා

බලපිටියේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 58ඒ/59.

බී. සේනාරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. ආසීර්වාදම් මහතා 1962 මැයි 14 වැනි දින සිට 16 වැනි දින දක්වා, රත්නපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා රත්නපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේ. එල්. 27ඒ/51 (III).

පී. එස්. ඩබ්ලිව්. අබේවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. කුමාරසාමි මහතා 1962 මැයි 14 වැනි දින සිට 17 වැනි දින දක්වා, මහනුවර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මහනුවර, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, දුම්බර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පීඑල්/එම්. 5/54.

ඊ. එම්. මතියපරනාම් සහ වී. සෝමසුන්දරම් යන මහතුන් නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. වී. සේනාතිරාජා මහතා 1962 මැයි 17 වැනි දින සිට 20 වැනි දින දක්වා, වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා වවුනියාවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පීඒඒ. 44/57.

එස්. ඒ. යටවර මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් හා සී. බී. හුනුකුඹුර මහතා නැති අතර, 1962 මැයි 4 වැනි දින, ආඩියාගල ගම්බද උසාවියේ අංක 309 සහ 311 දරණ අපරාධ නඩු හා අංක 261 සහ 262 දරණ සිවිල් නඩුද ඇසීමට, අනුරාධපුර දිස්ත්‍රික්කයේ තමන්කඩුව පලාතේ සහ කලාගම් පලාතේ ගම්බද උසාවි සභාපති ධුරයේ හා දකුණු හුරුළු පලාතේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඒඒ. 44/57.

එස්. ඒ. යටවර මහතා නැති අතර, සී. බී. හුනුකුඹුර මහතා 1962 මැයි 4 වැනි දින, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවර ගම් පලාතේ සහ බටහිර නුවරගම් පලාතේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී.9/59.

ජේ. පැට්රික් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ඒ. සී. එම්. මීරා සයිබු මහතා 1962 මැයි 21 වැනි දින සිට 23 වැනි දින දක්වා හා 25 වැනි හා 26 වැනි දිනයන්හි, මඩකලපු, දිස්ත්‍රික්කයේ අක්කරේ හා පනාම පත්තුවල ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එච්.1/48.

ටී. එල්. ජේ. හඩ්ජි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. එල්. සලහුදීන් මහතා 1962 මැයි 7 වැනි දින හා 8 වැනි දිනයන්හි, බදුලු දිස්ත්‍රික්කයේ වෙල්ලස්ස-බින්තැන්න සහ බුත්තල ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා යටිකිඳ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඊ.4/59.

ඩී. බී. ඇල්ලෙපොල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. එල්. සලහුදීන් මහතා 1962 මැයි 14 වැනි දින සිට 17 වැනි දින දක්වා, බදුලු දිස්ත්‍රික්කයේ, යටිකිඳ-වියලුව ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා බුත්තල ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී.7/56.

එම්. එම්. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ඩබ්ලිව්. ඒ. ඉමැනුවෙල් මහතා 1962 මැයි 21 වැනි හා 22 වැනි දිනයන්හි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිලි හත් පත්තුවේ හා හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී.7/56.

එම්. එම්. පෙරේරා මහතා නැති අතර, එස්. එච්. අබ්දුල්කාදර් මහතා 1962 මැයි 23 වැනි දින, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිලි හත්පත්තුවේ හා හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩබ්ලිව්.10/53.

පී. බී. වැත්තැව මහතා නැති අතර, ඒ. බී. රත්නායක මහතා 1962 මැයි 15 වැනි දින, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත් පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා වන්නි හත්පත්තුවේ, කටුගම්පොල හත්පත්තුවේ හා හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 මැයි 9 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කායාලය,
තැ. පෙ. අංකය—573,
කොළඹ—12.

5-536

---

# වෙනත් පත් කිරීම් ආදිය

**1962 අංක 193**

## ගැසට් නිවේදනයයි

(20 වෙනි පරිච්ඡේදය වන) ක්‍රිමිනල් නඩුවිධාන සංග්‍රහයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

අංක : අයිඑන්කහු/එල්. 14/3/62.

1962 අප්‍රේල් මස 23 වෙනි දින සිට එච්. එම්. ටී. බණ්ඩා මහතා නැවත වැඩ භාරගන්නා තුරු, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වන්නි හත්පත්තුවේ පහළ විසිදෙකේ කෝරළේ, හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩබැලීමට ඩී. එම්. රංබණ්ඩා මහතා ද,

අංක : අයිඑන්කහු/එල්. 4/3/61.

1962 අප්‍රේල් මස 20 වෙනි දින සිට ටී. විමලසිංහ මහතා නැවත වැඩ භාරගන්නා තුරු මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ දකුණ සහ නැගෙනහිර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට ඩී. කේ. පණ්ඩිතරත්න මහතා ද,

අංක : අයිඑන්කහු/එල්. 1/3/57.

1962 අප්‍රේල් මස 24 වෙනි දින සිට, එල්. පී. ඊ. කරුණාරත්න මහතා නැවත වැඩ භාරගන්නා තුරු, කොළඹ දිස්ත්‍රික්කයේ මීගමු නගර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට ක්‍රිස්ටි ද කෲස් මහතා ද,

අංක : අයිඑන්කහු/එල්. 9/3/57.

1962 මාර්තු මස 13 වෙනි දින සිට වී. සේල්ලතුරෙයි මහතා නැවත වැඩ භාරගන්නා තුරු, යාපනේ දිස්ත්‍රික්කයේ, කයිට්ස් කොට්ඨාශයේ අල්ලායි පිඩි ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට එස්. රත්නසභාපති මහතා ද,

අංක : ඒ. අයි 9/1/57.

1962 අප්‍රේල් මස 26 දින සිට යාපනය දිස්ත්‍රික්කයේ, පූනකාරි කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි ධුරයේ වැඩ බලන කාලය තුල, එම කොට්ඨාශයේ පරීක්ෂකවරයෙකු වශයෙන් කුමාරසාමි වේලුපිල්ලේ මහතා ද,

අංක : ඒ. අයි. 21/2/61.

1962 මැයි මස 2 වෙනි දින සිට මොනරාගල දිස්ත්‍රික්කයේ, මොනරාගල ප්‍රාදේශීය ආදායම් නිලධාරි ධුරය දරන කාලය තුල එම කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් එච්. ඒ. අභයගුණවර්ධන මහතා ද,

1962 මැයි මස 2 වෙනි දින සිට මොනරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය ප්‍රාදේශීය ආදායම් නිලධාරි ධුරය දරණ කාලය තුල, එම කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් ඩබ්ලිව්. ඇම්. පී. බී. මැණික්දිවෙල මහතා ද,

අංක : ඒ: අයි 3/2/62.

1962 අප්‍රේල් මස 24 වෙනි දින සිට සථිර පත්කිරීමක් කරන තුරු මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුවේ උඩගම්පහ හා පල්ලෙගම්පහ කෝරලයන්හි හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට බී. ඒ. ප්‍රේමවංශ මහතා ද,

අංක : ඒ. අයි. 1/1/62.

1962 අප්‍රේල් මස 23 වෙනි දින සිට සථිර පත්කිරීමක් කරන තුරු කොළඹ දිස්ත්‍රික්කයේ, අඹතලෙන් පහළ සහ කෝට්ටේ පේරුව කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට ඊ. බී. වීරකෝන් මහතා ද,

අංක : ඒ. අයි. 3/9/57.

1962 අප්‍රේල් මස 17 වෙනි දින සිට සපිර පත් කිරීමක් කරන තුරු මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර මැදපලාත ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට ආර් බී. වීරසේකර මහතා ද පත් කර ඇත්තේ ය.

ජී. පී. ඒ. සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන සපිර ලේකම්.

1962 මැයි මස 9 වෙනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

5-544

---

1962 අංක 194

## ගැසට් නිවේදනයයි

මගේ අංකය : ඒජේ. 3/3/61.

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

1. එල්. වී. ද සිල්වා මහතා පාණදුර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකාරුවකු වශයෙන් ද,
2. ඞී. සී. එම්. ගුණවර්ධන මහතා මාතර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,
3. ඒ. විකිරිබණ්ඩා මහතා අනුරාධපුර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද

පත් කර ඇත්තේ ය.

ජී. පී. ඒ. සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන
ස්ථිර ලේකම්.

1962, මැයි මස 9 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

5-558

---

1962 අංක 195

අංකය ඞී 33/රෙක් ට

## රාජකීය ලංකා නාවික හමුදා නිලධාරීන් ස්ථිර කිරීම

පහත සඳහන් නිලධාරියා 1961 ඔක්තෝබර් 1 වැනි දින සිට උප ලයිතන් පදවියේ ස්ථිර කරන ලදී.

වැඩ බලන උප ලයිතන් ඒ. ආර්. සී. ප්‍රනාන්දු, රා. ලං. නා. හ.

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 මැයි 3වෙනිදා,
කොළඹ දීය.

5-522

---

1962 අංක 196

අංකය : ඞී. 33/රෙක් ට.

## රාජකීය ලංකා ගුවන් හමුදාවේ උසස් කිරීම්

1962 ජනවාරි 1 වැනි දින සිට, ප්ලයිට් ලෙප්ටිනන් වරු වශයෙන් :—

පියසරු නිලධාරි පයාගලෙ නොයල් සරණපාල ප්‍රනාන්දු—01065—ගුවන් ගමනාගමන පාලනය.

පියසරු නිලධාරි වැලන්ටයින් ඩන්කන් ඇන්ස්ලීම් දිසානායක—01068—උපකරණ.

පියස්රු නිලධාරි මුරුගේසු මුතුකුමාරු—01069—උපකරණ.

පියසරු නිලධාරි ගොලුව මරක්කලගේ උපාලි ද සිල්වා—01062—පාලන.

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සපිර ලේකම්.

1962 මැයි 2 වෙනිදා,
කොළඹ දීය.

5-534

---

1962 අංක 197

## දැන්වීමයි

බෙන්තර මහගෙදර විජේසූරිය ආරච්චිගේ වෝල්ටර් ජයවර්ධන මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත් කර තිබේ.

කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සපිර ලේකම්.

1962 මැයි මස 3 වැනි දින,
කොළඹදීය.

5-470

---

1962 අංක 198

## දැන්වීමයි

එඩ්වඩ් හිල්ටන් සෙනෙවිරත්න මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත් කර තිබේ.

කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සපිර ලේකම්.

1962 මැයි මස 3 වැනි දින,
කොළඹදීය.

5-471

---

1962 අංක 199

## දැන්වීමයි

මානික්කුවදුර තිලක නෝර්මන් මැන්ඩිස් මහතා ගාල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත් කර තිබේ.

කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සපිර ලේකම්.

1962 මැයි මස 3 වැනි දින,
කොළඹදීය.

5-468

---

1962 අංක 200

## දැන්වීමයි

ජොන් නුසාමි තේවේන්ද්‍රපිල්ලේ මහතා ත්‍රිකුණාමලය අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත් කර තිබේ.

කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සපිර ලේකම්.

1962 මැයි මස 3 වැනි දින,
කොළඹදීය.

5-469

---

# රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය

1962 අංක 201

මෙහි පහත සඳහන් පත් කිරීම 1962.5.2 දින සිට ක්‍රියාත්මක වන ලෙස මවිසින් නියම කර ඇත :—

"සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ දෙවැනි ශ්‍රේණියේ ලිපිකරු එච්. කොඩිකාර මහතා කුරුණෑගල කායර්‍යාලයේ සේවය කරමින් කුරුණෑගල පාලන දිස්ත්‍රික්කයෙහි අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් කෙනෙකු වශයෙන්."

ඒ. එම්. එස්. පෙරේරා,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

1962 මැයි මස 2 වැනි දින,
කොළඹ, රෙජිස්ට්‍රාර් ජනරාල් කායර්‍යාලයේ දීය.

5-497

### 1962 අංක 202

ඇල්. ඞී.—බී 175 ඒ/29.

මෙහි පහත සඳහන් පත් කිරීම 1962.5.2 දින සිට ක්‍රියාත්මක වන ලෙස මවිසින් නියම කර ඇත:—

"සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ දෙවැනි ශ්‍රේණියේ ලිපිකරු ඩී. එෆ්. කුලතුංග මහතා පානදුරේ ශාඛා කාර්යාලයේ සේවය කරමින් කළුතර පාලන දිස්ත්‍රික්කයෙහි අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් කෙනෙකු වශයෙන්."

ඒ. එම්. එස්. පෙරේරා,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

1962 මැයි මස 2 වැනි දින,
කොළඹ, රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ දීය.

5-496

---

### 1962 අංක 203

මෙහි පහත සඳහන් පත් කිරීම 1962.5.2 දින සිට ක්‍රියාත්මක වන ලෙස මවිසින් නියම කර ඇත:—

"සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ දෙවැනි ශ්‍රේණියේ ලිපිකරු ඩබ්ලිව්. ඩී. විජේසිරිවර්ධන මහතා කළුතර ශාඛා කාර්යාලයේ සේවය කරමින් කළුතර පාලන දිස්ත්‍රික්කයෙහි අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් කෙනෙකු වශයෙන්."

ඒ. එම්. එස්. පෙරේරා,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

1962 මැයි මස 2 වැනි දින,
කොළඹ, රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ දීය.

5-493

---

### 1962 අංක 204

මෙහි පහත සඳහන් පත් කිරීම 1962.5.2 දින සිට ක්‍රියාත්මක වන ලෙස මවිසින් නියම කර ඇත:—

"සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ දෙවැනි ශ්‍රෙණියේ ලිපිකරු ඒ. කේ. ගුණසේකර මහතා ගාල්ලේ ශාඛා කාර්යාලයේ සේවය කරමින් ගාල්ල පාලන දිස්ත්‍රික්කයෙහි අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් කෙනෙකු වශයෙන්."

ඒ. එම්. එස්. පෙරේරා,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

1962 මැයි මස 2 වැනි දින,
කොළඹ, රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ දීය.

5-495

---

### 1962 අංක 205

මෙහි පහත සඳහන් පත් කිරීම 1962.5.2 දින සිට ක්‍රියාත්මක වන ලෙස මවිසින් නියම කර ඇත:—

"සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ දෙවැනි ශ්‍රේණියේ ලිපිකරු එම්. ඒ. යූ. පෙරේරා මහතා බදුල්ලේ ශාඛා කාර්යාලයේ සේවය කරමින් බදුල්ලේ සහ මොණරාගල පාලන දිස්ත්‍රික්කයන්හි අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් කෙනෙකු වශයෙන්."

ඒ. එම්. එස්. පෙරේරා,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

1962 මැයි මස 2 වැනි දින,
කොළඹ, රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ දීය.

5-494

---

## ආණ්ඩුවේ නිවේදන

පිඑන් 1287 (iii කාණ්ඩය).

### පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත

පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතෙහි (432 වෙනි අධිකාරය) 9 වෙනි වගන්තිය යටතේ තමා වෙත පැවරුණු බලතල ප්‍රකාර, මුදල් ඇමතිවරයා විසින් පනවනු ලැබූ නියෝග.

ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
මුදල් ඇමති.

1962, මැයි 12, කොළඹ.

#### නියෝග

1. කලින් කල සංශෝධනය කරනු ලැබූ ද, 1928 පෙබරවාරි 24 වැනි දින අංක 7,631 දරන ගැසට් පත්‍රයෙහි (එහි ව්‍යවස්ථා යන්නෙන් සඳහන් ව) පළ කරනු ලැබූ පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් නියෝගවල 11 වෙනි නියෝගය පහත දැක්වෙන පරිදි වැඩිදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි (I) වෙනි ඡේදයෙහි "ලංකා විශ්ව විද්‍යාලයෙහි" යන වචන වෙනුවට "රජයේ අරමුදල්වලින් ආධාර මුදලක් ගෙවනු ලබන ලංකාවේ යම් විශ්ව විද්‍යාලයක" යන වචන යෙදීමෙන් ද,

(2) එහි (VI) වෙනි ඡේදයෙහි—

(අ) "රජය යටතේ හෝ ලංකා විශ්ව විද්‍යාලය යටතේ ඔහුගේ සේවය" යන වචන වෙනුවට "රජයේ විශ්ව විද්‍යාලයක රජයේ අරමුදල්වලින් ආධාර මුදලක් ගෙවනු ලබන ලංකාවේ යම් විශ්ව විද්‍යාලයක" යන වචන යෙදීමෙන් ද,

(ආ) "හෝ විශ්ව විද්‍යාලයේ අර්ථසාධක අරමුදලෙහි" යන වචනවල සිට "ලංකා විශ්ව විද්‍යාලය" යන වචන දක්වා ඇති සියලු වචන වෙනුවෙන් "හෝ රජයේ සේවය සම්බන්ධයෙන් ඒ ගුරුවරයා දායකයකු වූ ඒ විශ්ව විද්‍යාලයේ අර්ථසාධක අරමුදලෙහි හෝ රජයේ අරමුදල්වලින් ආධාර මුදලක් ගෙවනු ලබන ලංකාවේ යම් විශ්ව විද්‍යාලයක" යන වචන යෙදීමෙන් ද,

(3) එහි (VII) වෙනි ඡේදයෙහි—

(අ) රජයේ හෝ "ලංකා විශ්ව විද්‍යාලයෙහි" යන වචන වෙනුවට "රජයේ හෝ රජයේ අරමුදල්වලින් ආධාර මුදලක් ගෙවනු ලබන ලංකාවේ යම් විශ්ව විද්‍යාලයක" යන වචන යෙදීමෙන් ද,

(ආ) "ලංකා විශ්ව විද්‍යාලයෙහි සේවා කාලය" යන වචන වෙනුවට "රජයේ අරමුදල්වලින් ආධාර මුදලක් ගෙවනු ලබන ලංකාවේ යම් විශ්ව විද්‍යාලයක සේවා කාලය" යන වචන යෙදීමෙන් ද,

(4) එහි (VIII) වෙනි ඡේදයෙහි අන්තිම අතුරු විධානයෙහි "ලංකා විශ්ව විද්‍යාලය" යන වචන වෙනුවට "රජයේ අරමුදල් වලින් ආධාර මුදලක් ගෙවනු ලබන ලංකාවේ යම් විශ්ව විද්‍යාලයක යන වචන" යෙදීමෙන් ද,

(5) එහි උපලේඛනයෙහි (3) වෙනි ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය, එනම්:—

"(3) රජයේ අරමුදල්වලින් ආධාර මුදලක් ගෙවනු ලබන ලංකාවේ යම් විශ්ව විද්‍යාලයක අධ්‍යයන හෝ පාලන කාර්ය මණ්ඩලයේ පත්වීම් දරන්නා වූ ද, ඒ විශ්ව විද්‍යාලයේ අර්ථසාධක අරමුදලට දායකයන් වන්නා වූ ද, නිලධරයන් අධ්‍යක්ෂගේ අනුමැතිය ඇතිව, පාසැල්වල ඔවුන්ගේ සේවය අවසන් කොට ඇත්නම් එ බඳු නිලධරයෝ." යෙදීමෙන් ද වේ.

2. පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් නියෝගවල (1) වෙනි නියෝගයෙන් කරනු ලැබූ සංශෝධන 1959 ජනවාරි 1 වෙනි දින පටන් ක්‍රියාත්මක ව, වලංගුව ඇතැයි සැලකිය යුතුය.

5-661

---

භාණ්ඩාගාරයේ අංකය : පී එන් 137/62 (බී).

පහත සඳහන් සේවය ද්විතීයනය කරන ලද නිලධාරීන්ගේ තාවකාලික වෘත්තීන්හි සේවා කාලය විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවෙ 24 වන වගන්තියේ කොන්දේසි අනුව, විශ්‍රාම වැටුප් කටයුතු සඳහා ගණන් ගැනීමට අනුමත කරණ බව මෙයින් නිවේදනය කරමි.

| | නම | | විශ්‍රාම වැටුප් සහිත පත්වීම | | ද්විතීයනය කළ තනතුර |
|---|---|---|---|---|---|
| 1. | ආර්. සෙල්වරත්නම් මහතා | ... | සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියේ II වන ශ්‍රෙණියේ ලිපිකරු | | ප්‍රගති සහකාර—ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව |
| 2. | එම්. ඒ. එස්. පෙරේරා මහතා | ... | එම | ... | එම |
| 3. | ජී. ඒ. ඩී. සිරිමල් මහතා | ... | දුම්රිය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියේ II වන ශ්‍රෙණියේ ලිපිකරු | | එම |

| | | |
|---|---|---|
| 4. ඒ. රාජපච්චම් මහතා | ... සහකාර ඉංජිනේරු | ... ඉංජිනේරු, ග්‍රාම සංවර්ධන හා ගෘහකර්මාන්ත දෙපාර්තමේන්තුව |
| 5. ඩී. ඩී. කේ. විමලරත්න මහතා | ... කාර්යාල කාර්ය සහායක | ... අනියම් පොත් බඳින්නා—ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව |
| 6. එම්. වයි. මොහමඩ් මහතා | ... කම්කරු | ... අනියම් බයිසිකල් ඕඩර්ලි—ජනලේඛන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව |
| 7. ඒ. එෆ්. ක්ෂෙවියර් මහතා | ... නැව් ශිල්පි —ධීවර දෙපාර්තමේන්තුව | ... ධීවර අභ්‍යාස මධ්‍යස්ථාන ආම්පන්න පිළිබඳ තාවකාලික උපදේශක |
| 8. කේ. එස්. ලියනගේ මහතා | ... එම | ... එම |
| 9. පී. පී. මානික්කම් මහතා | ... සංවර්ධන අංශයේ සහකාර ඉංජිනේරු—ග්‍රාම සංවර්ධන හා ගෘහකර්මාන්ත දෙපාර්තමේන්තුව | ලංකා වානේ සංයුක්ත මණ්ඩලයේ සේවය සඳහා |
| 10. එස්. කතිරාමලෙයිපිල්ලෙයි මහතා | ... වි. ලි. ප. II වන ශ්‍රෙණියේ ලිපිකරු | ... එම |
| 11. ජේ. එස්. ඩේවිඩ් මහතා | ... අ. ලි. සේ. ලිපිකරු | ... එම |
| 12. ඩබ්ලිව්. එම්. චන්ද්‍රසේකර මහතා | ... දුම්රිය ස්ථානාධිපති හා සහකාර දුම්රිය ස්ථානාධිපති සේවයේ II පෙල | තාවකාලික විමර්ෂන නිලධාරි—දුම්රිය දෙපාර්තමේන්තුව |
| 13. එච්. එල්. සිරිසේන මහතා | ... පොත් තබන්නා—ග්‍රාමසංවර්ධන හා ගෘහකර්මාන්ත දෙපාර්තමේන්තුව | ලංකා හාඩ්බෝඩ් සංයුක්ත මණ්ඩලයේ සේවය සඳහා |
| 14. කේ. සමරතුංග මහතා | ... ලං. සි. සේ. | ... රාජකීය නාවික හමුදව පිළිබඳ පරීක්ෂණ කොමිසමේ සේවය සඳහා |
| 15. ට්. ආර්. ද පොන්සේකා මහතා | ... ආණ්ඩුවේ නීතිඥ | ... එම |
| 16. එල්. එම්. පී. පී. වීරසිංහ මහතා | ... ආණ්ඩුවේ නීතිඥ | ... එම |
| 17. එම්. ඒ. ජේ. ද සිල්වා මහතා | ... ලිපිකරු සා. ලි. ප. | ... එම |
| 18. වී. තලයසිංහම් මහතා | ... ලඝුලේඛක (ඉහල ශ්‍රෙණිය), ලඝුලේඛක සේවය | ... එම |
| 19. ජේ. ඒ. ඩබ්ලිව්. පීරිස් මහතා | ... එම (පහල ශ්‍රෙණිය) | ... එම |
| 20. ඒ. පී. ද සොයිසා මහතා | ... යතුරු ලේඛක (ඉංග්‍රීසි), යතුරු ලේඛක සේවය | ... එම |
| 21. එස්. ඒ. ඩී. පෙරේරා මෙනෙවිය | ... එම (සිංහල) | ... එම |
| 22. එන්. ඒ. ද එස්. විජේසේකර මහතා | ... ලංකා අධිකරණ සේවයේ නිලධාරි | ... අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් |

සි. බාලසිංහම්,
භාණ්ඩාගාරයේ වැඩ බලන නියෝජ්‍ය ලේකම්.

මහා භාණ්ඩාගාරය,
කොළඹ, අප්‍රේල් මස 19, 1962.

5–475

---

අංකය : එල්. ඩී.බී. 59/58.

## 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනත

### 3 (2) වෙනි වගන්තිය යටතේ කරණ ලද දැන්වීමයි

1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 වෙනි වගන්තියේ 2 වෙනි උප වගන්තියේ විධිවිධාන අනුව, අධිකරණ ඇමති තැන්පත්, සැමුවෙල් පීටර් ක්‍රිස්ටෝපර් ප්‍රනාන්දු, වන මම, මෙහි ඇති උප ලෙඛනයේ සඳහන් එක් එක් ගම්ප්‍රදේශයක් සඳහා සමගිදායක යින්ගේ සභාවක් බැගින් පිහිටුවීමට අදහස් කර ඇති බව සහ ඒ ගම් ප්‍රදේශයේ ගම්කායයී සභාවද, ඒ ගම් ප්‍රදේශයේ සෑම ග්‍රාම සංවර්ධන සමිතියක් හා සෑම ප්‍රජාමණ්ඩලයක්ද, සමුපකාර සමිති ආඥාපනත යටතේ ලියා පදිංචි කරනු ලැබූ ඒ ගම් ප්‍රදේශයේ සෑම සමුපකාර සමිතියක්ද විසින්, නිර්දේශ මණ්ඩලයේ මතය පරිදි, ඒ සභාවේ සාමාජිකයන් වීමට සුදුසු තැනැත්තන්, 1962 ජූනි මස 25 වෙනි දින හෝ ඊට පළමු, මා වෙත නිර්දේශ කළ හැකි බව, මෙයින් දන්වමි.

සෑම්. පී. සී. ප්‍රනාන්දු,
අධිකරණ ඇමති.

1962 මැයි මස 10 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

### උපලෙඛනය

1. මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර සහ යටිනුවර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි ගඟපළාත (යටිනුවර) ගම් ප්‍රදේශය.
2. රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි නවදුන් කෝරළේ පල්ලෙපත්තු ගම් ප්‍රදේශය.
3. අනුරාධපුර දිස්ත්‍රික්කයේ හුරුළුපළාත ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි උලගල්ල කෝරළේ ගම් ප්‍රදේශය.
4. පුත්තලම් දිස්ත්‍රික්කයේ දකුණු පිටිගල් කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි කම්මල් පත්තු ගම් ප්‍රදේශය.

5-553

---

## 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් රථ ගමනාගමන පනත

### 25 (1) වෙනි වගන්තිය යටතේ කරණ නියෝගයයි

කම්කරු හා ජනසතු සේවා පිළිබඳ අමාත්‍ය ධුරන්ධර මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, මේ සමග ඇති උපලේඛනයෙහි දක්වා ඇත්තාවූද, ලංකා ගමනාගමන මණ්ඩලයේ කටයුතු සඳහා අත්කර ගැනීමට යෝජනා කර ඇත්තාවූද, නිශ්චල දේපළ අත්කර ගැනීම, 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් රථ ගමනා ගමන පනතේ 25 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මාවෙත පැවරී ඇති බලතල පිට, මෙයින් අනුමත කරමි.

ඇම්. පී. ද සොයිසා සිරිවර්ධන,
කම්කරු හා ජනසතු සේවා පිළිබඳ ඇමති.

1962 ක්වූ මැයි මස 3 වෙනි දින,
කොළඹදීය.

### උපලේඛනය

1. සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගල්බොඩ සහ කීනි ගොඩ කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, දියසුන්නත ගම්මුලාදෑනි කොට්ඨාශයේ, මොට්ටප්පුලිය ගමේ පිහිටි :—

2. උතුරට : වික්ටර් රාජපක්ෂට සහ ඇස්. ඇල්. ඇම්. හනිපාට අයිති ඉඩම් ; නැගෙනහිරට : එම ඉඩමේ කොටස ; දකුණට : කටුපිටිය සිට රඹුක්කන දක්වා, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ පාර ; බස්නාහිරට : එම ඉඩමේ කොටස ; යන මේ මායිම් තුල වූ රූඩ් 2 යි, පර්චස් 16 පමණ වර්ග ප්‍රමාණය ඇති ඉඩම.

3. අත්කර ගැනීමට ඇති ඉඩම් කැබැල්ලේ විස්තර මෙසේයි :—

ඉඩමේ නම : වඩියකනත්ත වත්ත ; වගාව : මුඩු බිම ; වර්ග ප්‍රමාණය : රූඩ් 2 යි, පර්චස් 16 ක් පමණ ; අයිතිකරුගේ නම සහ ලිපිනය : ඇස්. පී. ලීලාවතී, "පීකොක් විලා", මහර, රඹුක්කන.

5-647

## 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් රථ ගමනාගමන පනත

### 25 (1) වෙනි වගන්තිය යටතේ කරණ නියෝගයයි

කම්කරු හා ජනසතු සේවා පිළිබඳ අමාත්‍ය ධුරන්ධර මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, මේ සමග ඇති උපලේඛනයෙහි දක්වා ඇත්තාවූද, ලංකා ගමනාගමන මණ්ඩලයේ කටයුතු සඳහා අත්කර ගැනීමට යෝජනා කර ඇත්තාවූද, නිශ්චල දේපළ අත්කර ගැනීම, 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් රථ ගමනා ගමන පනතේ 25 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මාවෙත පැවරී ඇති බලතල පිට, මෙයින් අනුමත කරමි.

ඇම්. පී. ද ඉසැඩ්. සිරිවර්ධන,
කම්කරු හා ජනසතු සේවා පිළිබඳ ඇමති.

1962 ක්වූ මැයි මස 3 වෙනි දින,
කොළඹදීය.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ හෝමාගම ගම් මුලාදැනි කොටසේ, හෝමගම ගමේ පිහිටි ඒකාබද්ධ බිම් කැබලි දෙකක්, වර්ග ප්‍රමාණයෙන් අක්කර 4, රූඩ් 1, පර්චස් 31 ක් පමණ.

2. උතුරට : ඒ. ඩී. චාල්ස් අප්පුහාමිගේ ඉඩම සහ කොළඹ-අවිස්සාවේල්ල ප්‍රධාන පාර ; නැගෙනහිරට : බී. විලියම් සහ තවත් අයට අයිති ඉඩම ; දකුණට : කුඹුරු ; බස්නාහිරට : රබර් ඉඩම (අයිතිකරු කවරෙක් දැයි නොදනිසි.)

3. අත්කර ගැනීමට ඇති ඉඩම් කැබැලිවල විස්තර මෙසේය :—

(ඒ) කැබැල්ල :

ඉඩමේ නම : කන්දලන්ද ; වගාව : පොල් සහ රබර් ; වර්ග ප්‍රමාණය : අක්කර 4, රූඩ් 1, පර්චස් 20 පමණ ; අයිතිකරු : (කවරෙක් දැයි නොදනිසි.)

(බී) කැබැල්ල :

ඉඩමේ නම : (නමක් නොමැතිසි) ; වගාව : රබර් ; වර්ග ප්‍රමාණය : පර්චස් 11 ක් පමණ ; අයිතිකරු : හෝමාගම ඒ. ඩී. චාල්ස් අප්පුහාමි.

5-648

---

## බන්ධනාගාර ආඥාපණත

වර්ෂ 1939 අංක 53 දරණ ආඥාපණතින් සංශෝධනය කොට වර්ෂ 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශනයෙන් වෙනස් කර ඇති (44 වැනි පරිච්ඡේදය වන) බන්ධනාගාර ආඥාපණතේ 32 (1) (ආ) දරණ වගන්තියේ ප්‍රකාර, මෙහි උප ලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් තැනැත්තන්, මෙම දැන්වීමේ සඳහන් දින සිට එක් අවුරුදු කාලයකට, උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ආයතනයේ ප්‍රාදේශීය සෝදිසි කොමිටියේ සාමාජිකයන් වශයෙන්, කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු භාර ගරු ඇමතිවරයා විසින් පත් කොට තිබේ.

ඒ. අයි. මොහිඩීන්,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු
භාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවටය

1962 මැයි මස 9 වැනි දින,
කොළඹ 7.
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු
භාර අමාත්‍යාංශය,

### උපලේඛනය

| I | II |
|---|---|
| ගාලු බන්ධනාගාරය. | සී. පී. දිසානායක මහතා. |
| | යූ. ඒ කුලතිලක මහතා. |

5-526

## පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ රක්ෂිත ස්මාරක පිළිබඳ උපදේශක සභාව

රක්ෂිත ස්මාරක නැහැවිජීම් ආදිය පිළිබඳ ප්‍රශ්නවලදී පුරාවිද්‍යා කොමසාරිස්වරයාට උපදෙස් දීම සඳහා 1940 අංක 9 දරණ පුරාවිද්‍යා ආඥාපණතේ 21 (2) දරණ රෙගුලාසිය යටතේ 1961 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1964 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා වූ කාලය සඳහා ගරු කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පහත දැක්වෙන ගිහි පැවිදි සාමාජික භවතුන් පහත සඳහන් උපදේශක සභාවට හා ප්‍රාදේශීය උපදේශක මණ්ඩලවලට පත්කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

(අ) උපදේශක සභාව

(1) ඇස්. බී. ලේනව මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී, කැකිරාව.
(2) එච්. බී. කිරිමැටියාව දිසාව, වෙල්අට වලව්ව, මුල්ගම්පොල, මහනුවර.
(3) ජේ. ඩී. ඒ. පෙරේරා මහතා, ආබත්නොට් වීදිය, කොළඹ 8.
(4) ගරු ඉසුරුමුනියේ ශ්‍රී සංඝ රක්ඛිත නායක ස්වාමීන් වහන්සේ, ඉසුරුමුනි රජමහා විහාරය, අනුරාධපුරය.
(5) ගරු වලස්වැවේ සෝමසිරි ස්වාමීන් වහන්සේ, කුට්ටම් පොකුණ, අනුරාධපුරය.
(6) ගරු එච්. ශ්‍රී සුමන රේවත නායක ස්වාමීන් වහන්සේ, ශ්‍රී බෝමලු විහාරය, අනුරාධපුරය.
(7) භාරකාර, වන සත්වාරක්ෂක දෙපාර්තමේන්තුව, කොළඹ 1.
(8) මහාචාර්ය කේ. කනපතිපිල්ලෙ මහතා, ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙණිය.
(9) ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂක, කොළඹ 7.
(10) මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා, ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙණිය.
(11) ප්‍රධාන නිර්මාණ ශිල්පී, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව, කොළඹ 1.
(12) රජයේ නගර නිර්මාණ ශිල්පී, නගර හා ග්‍රාම නිර්මාණ කාර්යාංශය, කොළඹ 10.
(13) පී. එච්. විල්සන් පීරිස් මහතා, නාගරික නිර්මාණ ශිල්පී, නගර සභාව, කොළඹ 7.
(14) ඩී. ටී. දේවේන්ද්‍ර මහතා, 508, තිඹිරිගස්යාය පාර, කොළඹ 5.

(ආ) උතුරු මැද පළාතේ ස්මාරක පිළිබඳ උපදේශක මණ්ඩලය

(1) ගරු එච්. ශ්‍රී සුමන රේවත නායක සවාමීන් වහන්සේ, ශ්‍රී බෝමලු විහාරය, අනුරාධපුරය.
(2) ගරු වලස්වැවේ සෝමසිරි සවාමීන් වහන්සේ, කුට්ටම් පොකුණ, අනුරාධපුරය.
(3) ඇස්. බී. ලේනව මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී, කැකිරාව.
(4) එච්. බී. කිරිමැටියාව දිසාව, වෙල්අට වලව්ව, මුල්ගම්පොල, මහනුවර.
(5) මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා, ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙණිය.
(6) ඩී. ටී. දේවේන්ද්‍ර මහතා, 508, තිඹිරිගස්යාය පාර, කොළඹ 5.
(7) පී. එච්. විල්සන් පීරිස් මහතා, නාගරික නිර්මාණ ශිල්පී, නගර සභාව, කොළඹ 7.
(8) රජයේ නගර නිර්මාණ ශිල්පී, නගර හා ග්‍රාම නිර්මාණ කාර්යාංශය, කොළඹ 10.

(ඇ) ඌව, සබරගමු, මධ්‍යම සහ වයඹ පළාත්වල ස්මාරක පිළිබඳ උපදේශක මණ්ඩලය

(1) ගරු පණ්ඩිත හාලියාලේ ශ්‍රී සුමනතිස්ස නායක ස්වාමීන් වහන්සේ, අස්ගිරි මහා විහාරය, මහනුවර.
(2) ගරු පණ්ඩිත හේන්පිටගෙදර ඤාණසීහ ස්වාමීන් වහන්සේ, ශ්‍රී සුමන විද්‍යාලය, රත්නපුරය.
(3) ගරු පණ්ඩිත දඹවින්නේ සුමනසාර නායක ස්වාමීන් වහන්සේ, සුධර්මාලංකාර විශ්ව විද්‍යාලය පිරිවෙන, දියතලාව.
(4) ගරු මාහෙන්රුවේ ශ්‍රී පියරතන නායක ස්වාමීන් වහන්සේ, මුදුන්නේ විහාරය, උහුමීය, කුරුණෑගල.
(5) මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා, ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙණිය.
(6) ඇල්බට් ගොඩමුන්නේ මහතා, පෙරකදෝරුතැන, මහනුවර.
(7) හැරිස් ඇල්. රත්වත්ත දිසාව, දියවඩන නිලමේ, ශ්‍රී දළදා මාළිගාව, මහනුවර.

**(ඈ) බස්නාහිර සහ දකුණු පළාත්වල ස්මාරක පිළිබඳ උපදේශක මණ්ඩලය**

(1) ගරු කළුකොඳයාවේ පඤ්ඤාශේඛර නායක ස්වාමීන් වහන්සේ, විද්‍යොදය පිරිවෙන, මාලිගාකන්ද, කොළඹ 10.

(2) ගරු පණ්ඩිත වලගෙදර සෝමාලෝක තිස්ස නායක ස්වාමීන් වහන්සේ, මහාචේතිය පිරිවෙන, රත්දොඹේ, අම්බලන්ගොඩ.

(3) ප්‍රධාන නිර්මාණ ශිල්පී, ප්‍රසිඩ වැඩ දෙපාතීමේන්තුව, කොළඹ 1.

(4) භාරකාර, වන සත්වාරක්ෂක දෙපාතීමේන්තුව, කොළඹ 1.

(5) ඩී. ටී. දේවේන්ද්‍ර මහතා, 508, තිඹිරිගස්යාය පාර, කොළඹ 5.

**(ඉ) උතුරු සහ නැගෙනහිර පළාත්වල ස්මාරක පිළිබඳ උපදේශක මණ්ඩලය**

(1) මහාචාර්‍ය කේ. කනපතිපිල්ලෙ මහතා, ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙණිය.

(2) මහාචාර්‍ය සෙනරත් පරණවිතාන මහතා, ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙණිය.

(3) කේ. කනගරත්නම් මහතා, හිටපු ඔඩිටර් ජනරාල්, වඩ්ඩුක් කොඩෙයි.

(4) ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ, කොළඹ 7.

(5) ගරු පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී සුමංගල නන්දාරාම නායක ස්වාමීන් වහන්සේ, ශ්‍රී නාගවිහාරය, යාපනය.

ඇම්. ජේ. පෙරේරා,
කම්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම් වෙනුවට.

1962 මැයි මස 10 වැනි දින,
කම්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
කොළඹ 7.

5-521

---

## 1958 අංක 1 දරණ කුඹුරු පණත

1958 අංක 1 දරණ කුඹුරු පණත යටතේ ඉදිරිපත් කෙරෙන ඇපැල් පෙත්සම් විභාග කිරීම හා තීරණය කිරීම සඳහා එම පණතේ 59 (1) වගන්තියේ හා පණත යටතේ සකස් වී ඇති රෙගුලාසිවල විධිවිධාන අනුව පිහිටුවා ඇති සමීක්ෂණ මණ්ඩලයේ 1962. 5. 1 වැනි දින සිට අවුරුද්දක කාලයකට සභාපති හා සාමජිකයෙකු වශයෙන් සේවය කිරීම පිණිස පහත නම් සඳහන් අය ගරු කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලිබලය පිළිබඳ ඇමති තුමා විසින් පත් කර ඇති බව මහජනයා වෙත මෙයින් දනුම් දෙනු ලැබේ.

වී. ඇස්. ගුණවර්‍ධන මයා

ඩී. ජී. එල්. මිසෝ,
සථිර ලේකම්.

1962 මැයි මස 7 වැනි දින,
කොළඹ 1. කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලිබලය පිළිබඳ අමාත්‍යාංශයේ දීය.

5-478/1

---

## 1958 අංක 1 දරණ කුඹුරු පණත

1958 අංක 1 දරණ කුඹුරු පණත යටතේ ඉදිරිපත් කෙරෙන ඇපැල් පෙත්සම් විභාග කිරීම හා තීරණය කිරීම සඳහා එම පණතේ 59 (1) වගන්තියේ හා පණත යටතේ සකස් වී ඇති රෙගුලාසිවල විධිවිධාන අනුව පිහිටුවා ඇති සමීක්ෂණ මණ්ඩලයේ සේවය පිණිස 1962 අප්‍රියෙල් මස 28 වැනි දින සිට අවුරුද්දක කාලයක් පහත නම් සඳහන් අය ගරු කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබලය පිළිබඳ ඇමති තුමා විසින් සාමාජිකයෙක් වශයෙන් පත් කර ඇති බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

යු. එල්. එම්. අන්වර් මහතා,

ඩී. ජී. එල්. මිසෝ,
නිත්‍ය ලේකම්.

කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලිබලය පිළිබඳ අමාත්‍යාංශය,
1962 මැයි මස 7 දින,
කොළඹදීය.

5-4[illegible]

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡෙදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡෙදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡෙදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමති,

1962 මැයි මස 8 වැනි දින දීය,
කොළඹ 2.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ මීනුවන්ගොඩ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ අංක 58 දරණ බටේපොල ගම්මුලාදෑනි වසමේ පිහිටි බෙන්ජීන්වත්ත නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 2ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස ; නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස ; දකුණට : පේදුරු ප්‍රනාන්දු අයිතිවාසිකම් කියන ඉඩම ; බස්නාහිරට : කතෝලික පල්ලියට අයිති ඉඩම්.

5-556

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට අයතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමතිතුමා.

1962 අප්‍රේල් 30 වැනි දින දීය.
කොළඹ 2.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ අධිකාරි පත්තු ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ අංක 286 දරණ ගෝනහේන ගම්මුලාදෑනි වසමේ පිහිටි දෙල්ගහ වත්ත නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති පර්චස් 80 ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක්.

උතුරට : ඇන්. ඇල්. ජූලියන් සිල්වාට අයිති ඉඩම ; නැගෙනහිරට : වෙල ; දකුණට : සරප්පුවත්ත ; බස්නහිරට : ගෝනහේන මීගහවත්ත ප්‍රසිද්ධ පාර.

5-492

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමතිතුමා.

1962 අප්‍රේල් 30 වෙනි දින දීය.
කොළඹ 2.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සියනෑකෝරලයේ මැද පත්තුව ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ අංක 291 දරණ හේනගම ගම්මූලාදෑනි වසමේ පිහිටි අඹගහවත්ත, මිල්ලගහවත්ත, හල්ගහකුඹුර, හෙවත් ලුනුම්දෙල්ල ගහවත්ත නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කරයක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක්.

උතුරට : රජයේ ඉඩම ; නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස ; දකුණට : හේනගම මහ විද්‍යාලයට අයිති ඉඩම ; බස්නාහිරට : විද්‍යාලයට යන පාර.

5-4[illegible]

### ... දරණ ජාතික නිවාස පනත

...9 ඡේදය යටතේ සහතිකය

...ාන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන ..., 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමති තුමා.

කොළඹ 2,
1962 අප්‍රේල් 30 වෙනි දින දිය.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, බටහිර සියනෑ කෝරළේ මැද පත්තුව ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ අංක 295 දරණ බටේපොල ගම්මුලාදෑනි වසමේ පිහිටි කහටලන්ද නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මැයිම් ඇති අක්කරයක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක්.

උතුරට: කේ. අර්ර්නෝලිස් මහතාට අයිති ඉඩම; නැගෙනහිරට: ආර්. ඊ. ආර්. ගුණසේකර මහතාට අයිති ඉඩම; දකුණට: එම ඉඩමේ ඉතිරි කොටස; බස්නාහිරට: ගම්සභා පාර.

5-488

---

### 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමති තුමා.

කොළඹ 2,
1962 අප්‍රේල් 30 වෙනි දින දිය.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ බටහිර අධිකාරිපත්තු ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ අංක 281 දරණ වල්ගම ගම්මුලාදෑනි වසමේ පිහිටි නුගගහලන්ද නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මැයිම් ඇති අක්කර 1, ¼ ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක්.

උතුරට: එච්. ඒ. ඇල්. ඇම්. තාහීර් මහතාට අයිති ඉඩම; නැගෙනහිරට: යටිහේන දෙකටන ප්‍රසිද්ධ පාර; දකුණට: කොළඹගේන පාර; බස්නාහිරට: එම ඉඩමේ ඉතිරි කොටස.

5-489

---

### 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමතිතුමා.

කොළඹ 2,
1962 අප්‍රේල් 30 වැනි දින දිය.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ අධිකාරි පත්තු ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ අංක 286 දරණ ගෝනහේන ගම්මුලාදෑනි වසමේ පිහිටි දෙල්ගහ වත්ත නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මැයිම් ඇති පර්චස් 120 ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක්.

උතුරට: ගෝනහේන වැබඩ ගම්සභා පාර; නැගෙනහිරට: ඇල්. ජූලියන් සිල්වා මහතාට අයිති ඉඩම; දකුණට: ඇල්. ජූලියන් සිල්වා මහතාට අයිති ඉඩම; බස්නාහිරට: හේන මිගහවත්ත ප්‍රසිද්ධ පාර.

5-490

---

### 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමති තුමා.

කොළඹ 2,
1962 අප්‍රේල් 30 වෙනි දින දිය.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ බස්නාහිර අධිකාරී පත්තුවේ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ ඉහළ කරගහමුල්ල ගම්මුලාදෑනි වසමේ පිහිටි ගල්හේනවත්ත නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මැයිම් ඇති අක්කරයක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක්.

උතුරට: එම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: එම ඉඩමේ ඉතිරි කොටස; දකුණට: එම ඉඩමේ ඉතිරි කොටස; බස්නාහිරට: කඩවත ගනේමුල්ල පාර.

5-491

---

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### අංක 5/62 දරන අපනයන පාලන දැන්වීම

පොල් පුන්නක්කු අපනයනය

1961.10.24 දතමින් යුත් අංක 13/61 දරණ මගේ අපනයන පාලන දැන්වීමට වැඩිමනත් වසි. පොල් පුන්නක්කු අපනයනයට 1962 සඳහා බලපත්‍ර නිකුත් කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

1962.5.31 වෙනි දින දක්වා වලංගු වන පරිදි නිකුත් කල බලපත්‍රවල වලංගු කාලය එම දිනයෙන් පසු දීර්ඝ නොකරනු ඇත.

සී. මයිල්වාගනම්,
ආනයන හා අපනයන පාලක.

1962 මැයි මස 14 වෙනි දින,
කොළඹදිය.

5-646

---

### දැන්වීමයි

පේරාදෙනියේ ලංකා විශ්ව විද්‍යාලයේ දනට පාඨමාලා අනුගමනය කරන රජයේ හා අධ්‍යක්ෂ පාලිත පාඨශාලා ගුරු භවතුන් ගෙන් 1962.5.31 වැනි දින හෝ ඊට කලින් කොළඹ 2, මැලේ විදියේ ජ. පා. ශාඛාවේ අධ්‍යාපනාධ්‍යක්ෂවරයා වෙත මෙහි පහත සඳහන් විස්තර ලැබෙන සේ විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරි මගින් එවන ලෙස මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. මේ වර්ෂයේ විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගයෙන් සමත්ව පේරාදෙනියේ එම විශ්ව විද්‍යාලයට ඇතුළත් වීමට යෝග්‍යව ඇති සියලුම ගුරුවරුන් ද 1962.5.31 වැනි දින හෝ ඊට කලින් කොළඹ 2, මැලේ විදියේ ජා. පා. ශාඛාවේ අධ්‍යාපනාධ්‍යක්ෂවරයා වෙත මෙම විස්තර ලැබෙන සේ විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරි මගින් එවන ලෙස නිවේදනය කරනු ලැබේ.

3. තම තමන් විසින් එවන ලද ඉල්ලුම් පත් මෙහි ලැබී තිබේදැයි සොයා බැලීමට එම ඉල්ලුම්කරුවන් හට සතියේ දිනවල සවස 3 සිට 4.30 දක්වා ඉඩ ඇත. මෙසේ සොයා බැලිය හැකි අවසාන දිනය 1962.6.4 වැනිදා වන්නේ ය.

ඇස්. ආර්ප්. ද සිල්වා,
අධ්‍යාපනාධ්‍යක්ෂ.

අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
මැලේ විදිය, කොළඹ 2,
1962 ක්වූ මැයි මස 10 වැනි දින දිය.

(සම්පූර්ණ නම :————.

ගුරුවරයකු වශයෙන් ලියාපදිංචි කර ඇත් නම්, එම අංකය : ————.

උපන් දිනය :————.

පුද්ගලික ලිපිනය :————.

( ) ගුරු භවතා අන්තිමට සේවය කළ පාසැලේ නම හා ලිපිනය : ————.

( ) පාඨශාලාවේ කළමණාකාරිත්වය (රජයේ, අධ්‍යක්ෂ පාලිත හෝ ආධාර නොලබන බව) :————.

අධ්‍යාපන සුදුසුකම් :————.

සේවා කාල පරිච්ඡේදය :————.

( ) කලින් අධ්‍යයන නිවාඩු ලබා ඇත්තේද? එසේ නම් එම නිවාඩු කාල පරිච්ඡේදය හා එය දෙන ලද කාර්යය සඳහන් කරන්න :————.

ශිෂ්‍යත්වයකට ඇතුලත්වී තිබේ නම්, එහි කාල පරිච්ඡේදය : ————සිට————තෙක්.

( ) ගුරු භවතා විශ්ව විද්‍යාලයයේ අනුගමනය කිරීමට අදහස් කිරීමට අදහස් කරන පාඨමාලාව (අධ්‍යාපන ඩිප්ලෝමා, කලා සාමාන්‍ය උපාධිය හෝ විද්‍යාව යන බව) : ————.

විෂයයෝ :————.

පාඨමාලාව පටන් ගත් දිනය :————.

පාඨමාලාවේ කාල පරිච්ඡේදය :————.

( ) අධ්‍යාපනාධ්‍යක්ෂවරයා විසින් දැනටම නිවාඩු දී තිබේ නම් එම ලිපියේ අංකය හා දිනය සඳහන් කරන්න :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

…ය :————.

…59

## මාර/ධම්ද්වජ පිරිවෙණ, දෙනියාය

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ දෙනියායේ පිහිටි ඉහත සඳහන් පිරිවෙණ රජයේ ආධාර ලබන පිරිවෙණක් ලෙස තාවකාලික …යෙන් 4.1.61 දින සිට ලියා පදිංචි කළ බව මෙසින් දන්වමි.

ඇස්. ඇෆ්. ද සිල්වා,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

ඊ. ඇස්. බී. 9
1962 ක්වූ මැයි මස 9 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

5-555

## වව්වටප්පලායි කන්නකායි අම්මාන් කෝවිලේ පොන්ගල් උත්සවය—1962

ඉහත සඳහන් කෝවිලේ වාර්ෂික උත්සවය සිරිත් පරිදි මෙවරද වර්ෂ 1962 කේ මැයි මස 21 වෙනි දින උදය 6 ට පටන් ගෙන 22 වෙනි දින උදය 7 ට කෙලවර කෙරෙණ බව මහජනයාගේ සහ ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයගේ දැනගැනීමට මෙයින් නිවේදනය කරමි. මෙම උත්සවයට සහභාගිවන අය වට්ටප්පලායි කන්නකායි කෝවිලේ පොන්ගල් උත්සවය පිළිබඳව වර්ෂ 1949. 5. 27, අංක 9,978 සහ 1950. 5. 26 වෙනි දින අංක 10,105 දරණ රජයේ ගැසට් පත්‍රවල පළවූ නිවේදනවලට අවධානය යොමුකරවීම වටී.

එසේ ප්‍රසිද්ධ කල නිත්‍ය රෙගුලාසි මේ උත්සවය පැවැත්වෙන කාලසීමාව තුලද වලංගුවනවා ඇත.

ඊ. සරවනපවන්,
වවුනියා දිසාවේ රජයේ දිසාපති වෙනුවට.

දිසාපති කාර්යාලයය,
වවුනියාව,
62.5.12 වෙනි දින දීය.

…621

## වර්ෂ 1962 කතරගම ඇසළ පෙ…

කතරගම සහ සෙල්ල කතරගම වන්දනා ගමන් පිළි… පනවා තිබෙන වර්ෂ 1948 අප්‍රේල් මස 30 වැනි දින අංක 9,859 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේද, වර්ෂ 1949 ජූලි මස 22 වැනි දින අංක 10,000 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේද, වර්ෂ 1958 පෙබරවාරි මස 7 වැනි දින අංක 11,225 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේද, වර්ෂ 1961 ජූලි මස 7 වැනි දින අංක 12,508 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 1962 මාර්තු මස 2 වැනි දින අංක 12,947 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේද පෙනී යන ආකාර පහත සඳහන් ව්‍යවස්ථා මහජනයාගේ කල්පනාවට භාජන කරමි.

ඒ සම්බන්ධ දැනුම් දෙන වගනම් :—

(අ) බලය ලත් නිලධාරියෙකුගෙන් අවසර පත්‍රයක් නොමැතිව කතරගම හෝ සෙල්ල කතරගම කඳවුරු ප්‍රදේශවල මොනම තාවකාලික ගොඩනැගිල්ලක්වත් ඉදිකිරීම තහනම්ය.

(ආ) කතරගම පූජනීය ස්ථාන පිහිටි සීමාව තුළ වෙළඳ පොලවල් පිණිස තාවකාලික ගොඩනැගිලි පාවිච්චි කිරීමට අවසර දෙනු නොලැබේ.

එනම් :—1. මහ වීදිය.

2. පිට වීදිය.

3. පිට වීදිය සහ නාග වීදිය අතර තිබෙන බුත්තල පාර කොටස.

4. මහ වීදිය සහ පිට වීදිය ඒකාබද්ධ වන පාරවල්.

5. මහ දේවාලය, වල්ලිඅම්මා දේවාලය, තෙයිවානි අම්මා දේවාලය යන දේවාල අවට ප්‍රදේශ.

(ඉ) කොන්ක්‍රීට් අඩි පාලමෙන් පහල හැර ගඟේ සිට යාර 100ක් ඇතුළත කතරගම කඳවුරු ප්‍රදේශයේ කොයිම ස්ථානයකවත් හිසකෙස් හෝ රැවුල් කපන ස්ථාන පිහිටුවීමට ඉඩ දෙනු නොලැබේ.

(ඊ) කතරගම මැණික් ගඟෙහි ගවයන් නෑවීමට වෙන්කර තිබෙන කොටසට පහලින් නෑමට හෝ වතුර ගැනීමට ඉඩ දෙනු නොලැබේ. හදිසි රෝග බෝවීම වැලැක්වීම පිණිස නෑමට, බීමට සහ ගවයින් නෑවීමට විශේෂයෙන් වෙන්කර තිබෙන ස්ථාන පාවිච්චි කළ යුතුයි.

(උ) බලයලත් නිලධාරියකුගේ අවසර පත්‍රයක් නොමැතිව කඳවුරු ප්‍රදේශය ඇතුළත බයිසිකල් සහ කරත්ත ඇතුලු මොනයම් රථ වාහනයක්වත් තැබීමට ඉඩ දෙනු නොලැබේ.

(ඌ) සෙල්ල කතරගම ගං ඉවුරෙන් යාර 50ක් ඇතුළත මොන යම් තාවකාලික ගොඩනැගිල්ලක්වත් ඉදිකිරීම තහනම්ය.

(එ) කිරිවෙහෙර සිට සෙල්ල කතරගම දක්වා ඇති මාර්ගයෙහි කිරි වෙහෙර සිට සැ. ½ බඹිනෙන් පටන් ගෙන, සෙල්ලකතරගම පූජනීය ස්ථානයෙන් සැ. ½ මොබිනෙන් කෙලවරවන පෙදෙස හැර කතරගම කඳවුරු පෙදෙස තුළදී—හිඟමන් ඉල්ලීම හෝ යැදීම කළ නොහැක.

(ඒ) ඉහත (එ) හි සඳහන් ප්‍රදේශය තුළදී හැර කඳවුරු ප්‍රදේශය තුළදී මුදලින් හෝ අන්කිසි දෙයකින් හිඟන්නන්ට හිඟමන් දීම හෝ බෙදදීම කළ නොහැක.

මෙම ව්‍යවස්ථාවන්ට විරුද්ධව ක්‍රියාකරන අයට නීති ප්‍රකාර නඩු පවරනු ලැබේ.

වි. ආ. දෙ. ස. දේ. සපරමාදු,
මොණරාගල දිස්ත්‍රික්කයේ වැඩ බලන
දිසාපති තැන.

1962 මැයි මස 9 වැනි දින,
මොණරාගල දිසාපති කාර්යාලයේදීය.

5-607/1

## වර්ෂ 1962 කතරගම ඇසළ උත්සවය

වර්ෂ 1948 ක්වූ අප්‍රේල් මස 30 වෙනි දින අංක 9,859 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ, වර්ෂ 1948 ක්වූ අප්‍රේල් මස 16 වැනි දින දරණ කතරගම සහ සෙල්ල කතරගම වන්දනා ගමන් පිළිබඳ ව්‍යවස්ථා අනුව මොණරාගල දිස්ත්‍රික්කයේ වැඩ බලන දිසාපති තැන්පත් වික්‍රමසිංහ ආරච්චිගේ දෙන් සනත්කුමාර දේවප්‍රිය සපර මාදු වන මම මෙහි පහත සඳහන් ප්‍රදේශ නා නා ප්‍රකාර බඩු වර්ග විකිණීම සඳහා සීමා කරමි.

1. මහ වීදිය හා පිට වීදිය දිගේ මෙම පාරවල් දෙක යාවෙන පාර දෙකෙළවර පිහිටි සථිර ගොඩනැගිලි,

2. නාගහ වීදියේ ගොඩනැගිලි,

...ගහ වීදිය හන්දි වන ස්ථානයේ සිට බුත්තල දෙසට තිබෙන ගොඩනැගිලි,

...රගම ප්‍රසිද්ධ මහ පාර සහ කටගමුව පාර සන්දි වන ...ථානයේ සිට කටගමුව පාරේ දකුණු දෙසට තිබෙන ගොඩනැගිලි,

5. තිස්ස-කතරගම ප්‍රසිද්ධ මහ පාර සහ කටගමුව පාර සන්දි වන ස්ථානයේ සිට තිස්ස-කතරගම ප්‍රසිද්ධ මහ පාරේ උතුරු දෙසට තිබෙන ගොඩනැගිලි,
6. සෙල්ල කතරගම පිහිටි සථිර ගොඩනැගිලි,
7. බලයලත් නිලධාරියෙකුගේ අවසරපත් පිට සෙල්ල කතරගම සාදන ලද තාවකාලික ගොඩනැගිලි,
8. කිරි වෙහෙරට මුහුන ලා ඇති පාරේ සංචාරක බංගලාවේ වැට බැඳ ඇති සීමාවේ සිට කිරි වෙහෙර මළුව දක්වා,

පාර මධ්‍යයේ සිට ගොඩනැගිලි ඉදිරිපස දුර ප්‍රමාණය අඩි 50 ට අඩුව හැර තිබුනොත් එම ගොඩනැගිල්ල එම පාරේ පිහිටි ගොඩ නැගිල්ලක් හැටියට සලකනු ලැබේ. මේ හැර වෙන කිසිම ස්ථානයක කඳවුරු ප්‍රදේශයේ වෙළඳාම් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

වි. ආ. දෙ. ස. දේ. සපරමාදු,
මොණරාගල දිස්ත්‍රික්කයේ වැඩ බලන
දිසාපති තැන.

1962 මැයි මස 9 වැනි දින,
මොණරාගල දිසාපති කායභීලයේ දීය.

5-607/2

---

## වර්ෂ 1962 කතරගම ඇසළ පෙරහැර

වර්ෂ 1948 ක්වූ අප්‍රේල් මස 30 වැනි දින අංක 9,859 යේ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ වර්ෂ 1948 ක්වූ අප්‍රේල් මස 1 වන දින දරණ කතරගම සහ සෙල්ල කතරගම වන්දනා ගමන් පිළිබඳ 10 (1) ව්‍යවස්ථාව අනුව මොණරාගල දිස්ත්‍රික්කයේ වැඩ බලන දිසාපති තැන්පත් වික්‍රමසිංහ ආරච්චිගේ දෙන් සනත්කුමාර දේවප්‍රිය සපරමාදු වන මම මෙහි පහත සඳහන් ස්ථාන වන්දනා කරුවන්ට ආහාර බෙදුදීමේ හෝ විකිණීමේ ස්ථාන හැටියට නියම කරමි.

1. මහ වීදිය හා පිට වීදිය දිගේ පිහිටි බලය ලත් සථිර ගොඩ නැගිලි,
2. මෙහි පහත සඳහන් පාරවල් දිගේ එම පාරවල් වලට මුහුණු පා සාදු තිබෙන අවසර ලත් ගොඩනැගිලි සහ මගේ අවසරය පිට සාදන ලද තාවකාලික ගොඩනැගිලි,
   (අ) නාගහ වීදිය.
   (ආ) තිස්ස-කතරගම ප්‍රසිද්ධ පාර සහ කටගමුව පාර සන්ධිවන ස්ථානයෙන් කටගමුව පාරේ දකුණු දෙසට.
   (ඉ) තිස්ස-කතරගම ප්‍රසිද්ධ මහපාර සහ කටගමුව පාර සන්ධිවන ස්ථානයේ තිස්ස-කතරගම පාරේ උතුරු දෙසට.
3. මගේ අනුමැතිය පිට තෙයිවානි අම්මා කෝවිල් ප්‍රදේශය ඇතුළත සාදු තිබෙන සථිර ගොඩනැගිලි.
4. සෙල්ල කතරගම තිබෙන අවසරලත් සථිර ගොඩනැගිලි සහ මගේ අනුමැතිය පිට සාදන ලද තාවකාලික ගොඩනැගිලි.
5. බුත්තල පාරත් නාගහපිටියත් සන්ධිවන ස්ථානයෙන් උතුරට පිහිටි සථිර ගොඩනැගිලි.
6. කිරිවෙහෙරට මුහුණ ලා ඇති පාරේ සංචාරක බංගලාවේ වැට බැඳ ඇති සීමාවේ සිට කිරි වෙහෙර මළුව දක්වා ඇති සථිර ගොඩ නැගිලි.

පාර මැද්දේ සිට ගොඩනැගිල්ල ඉදිරිපස දුර ප්‍රමාණය ... අඩුව තිබුනොත් එම ගොඩනැගිල්ල එම පාරේ පිහිටි ගොඩන... හැටියට මෙම දැන්වීමෙන් සලකනු ලැබේ.

ඉහත සඳහන් ස්ථාන හැර කතරගම හෝ සෙල්ල කතරගම... ප්‍රදේශය ඇතුළත අන් කිසි ස්ථානයක මොනම අන් දමේ කෑ... බීමක් විකිණීම හෝ බෙදා දීම හෝ තහනම් ය.

වි. ආ. දෙ. ස. දේ. සපර...
මොණරාගල දිස්ත්‍රික්කයේ වැ...
දිසාපති තැන.

1962 මැයි මස 9 වැනි දින,
මොණරාගල දිසාපති කාර්යාලයේ දීය.

5-607/3

---

## 1962 කතරගම ඇසළ උත්සවය

1962 කතරගම ඇසළ උත්සවය ජූලි මස 2 වැනි දින ආ... එම මස 19 වැනි දින අවසන් වනු බව මහජනයාගේ දැනගැනීම... මෙයින් දැනුම් දෙමි.

ස. දේ. සපරමාදු,
මොණරාගල දිස්ත්‍රික්කයේ දිසා...

1962 මැයි මස 9 වැනි දින,
මොණරාගල කච්චේරියේ දීය.

5-607/4

---

## රථවාහනවලට අවහිර

දකුණු කොට්ඨාශය, ඇල්පිටිය දිස්ත්‍රික්...

### කෙල්ලපොත-හොරන්ගල්ල පාර—අංක 2/4 දරන පා...

තව දුරටත් නිවේදනය කරනු තෙක් ඉහත සඳහන් පාළම 19... මැයි මස 15 වෙනි දින සිට රථ වාහන සඳහා වසා තබනු ලැබේ.

අම්බලන්ගොඩ-ඇල්පිටිය-පිටිගල පාර සහ තල්ගස්වල-පිටිගල ය... මාර්ගයන් මේ වෙනුවට පාවිච්චි කිරීමට ඇති අතිකුත් මාර්ගයන් ...

වී. ඊ. හේරත්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුව...

5-554

---

## රථවාහන ගමනාගමනයට බාධා

### දකුණු-කොළඹ දිස්ත්‍රික්කයේ, එළුවිල-අරුග්ගොඩ පාරේ අංක 2 ... දරන බෝක්කුව

ඉහත සඳහන් බෝක්කුව වසා තැබීමේ කාලය තවත් සති හතරකින් දීර්ඝ කර ඇති බව මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම මාර්ගය වෙනුවට, අළුබෝමුල්ල-අළුත්ගම මාර්ගය යොදා ගත හැකිය.

වී. ඊ. හේරත්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

1962 මැයි මස 8 වෙනි දින,
කොළඹ, රජයේ වැඩ කාර්යාලයේදීය.

5-560

---

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඛ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.**

---

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි